# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 පෙබරවාරි මස 09 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.02.09 දින නිකුත් කරන ලදී)**


# බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට භාජන වූ වින්දිතයන්ට යුක්තිය පසිඳලීමේ සහ වන්දි ලබා ගැනීමේ අයිතිවාසිකම සහතික කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 13.00 යි.    තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

# බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය

එල්.ඩී.—ඕ. 9/2016.

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට භාජනය වූ වින්දිතයන්ට යුක්තිය පසිඳලීමේ සහ වන්දි ලබා ගැනීමේ අයිතිවාසිකම සහතික කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

(මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට 2015 දෙසැම්බර් මස 10 වන දින ශ්‍රී ලංකාව අත්සන්කාර පාර්ශවයක් වූ හෙයින් ද;

2016 මැයි මස 3 වන දිනැති වූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා වෙත 2016 මැයි මස 25 වන දින තැන්පත් කරන ලද්දා වූ ද අපරානුමත කිරීමේ සාධන පත්‍රයක් මඟින් ශ්‍රී ලංකාව ඉහත කී සම්මුතිය අපරානුමත කර ඇති හෙයින් ද;

ඉහත කී සම්මුතිය ශ්‍රී ලංකාවට අදාළව 2016 ජුනි මස 24 වන දින සිට බලාත්මක වීම ආරම්භ වී ඇති හෙයින් ද;

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සම්පාදනය කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට අවශ්‍ය වී ඇති බැවින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2017 අංක   දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සහතික කිරීමේ දිනයේ සිට බලාත්මකභාවයට පත් විය යුතු ය. ලුහුඬු නාමය.

**2.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සම්මුතියට පාර්ශවකරුවන් වන රාජ්‍ය සහතික කරනු ලැබිය යුතු ය. මෙම වගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබූ යම් රාජ්‍යයක් මින් මතු "සම්මුති රාජ්‍යයක්" වශයෙන් හඳුන්වනු ලැබිය යුතු ය. සම්මුති රාජ්‍ය.

2—PL 005015—475 (2017/02)

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම ආදිය.

**3.** (1) යම් තැනැත්තකු රජයේ නිලධරයකු වශයෙන් සිටිමින් හෝ රජයේ බලය පැවරීමක් මත ක්‍රියා කරමින් හෝ රජයේ බලය පැවරීම, සහාය සහ අනුදැනුම ඇතිව ක්‍රියාකරමින් -

(අ) වෙනත් යම් තැනැත්තකු සිරභාරයට ගන්නා, රඳවා තබා ගන්නා, අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැරගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; සහ

(ආ) (i) එම සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම, අයුතු ලෙස සිරකර තබා ගැනීම, පැහැර ගෙනයාම, අපහරණය කිරීම හෝ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ii) එවැනි වෙනත් යම් තැනැත්තකුගේ ඉරණම සඟවන; හෝ

(iii) එකී වෙනත් යම් තැනැත්තකුගේ තදනන්තර හෝ වර්තමානයේ සිටින ස්ථානය හෙළිදරව් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැතහොත් වලංගු හේතුවක් නොමැතිව හෙළිදරව් කිරීමට නොහැකි වන,

යම් තැනැත්තෙක් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට වරදකරු වන අතර, මහාධිකරණය විසින් අධිචෝදනා මත නඩු විභාග කිරීමෙන් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට එම තැනැත්තා යටත් වන අතර, රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට ද ඔහු යටත් වන අතර තවදුරටත් වින්දිතයෙකුට රුපියල් ලක්ෂ පහකට අඩු නොවන වන්දි මුදලක් ගෙවීමට ද එම තැනැත්තා යටත් විය යුතු ය.

(2) (අ) වෙනත් යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තබා ගන්නා, පැහැර ගෙන යන, අපහරණය කරන හෝ වෙනත් යම් ආකාරයකින් එම තැනැත්තාගේ නිදහස අහිමි කරන; සහ

(ආ) (i) එම අයුතු ලෙස සිරකර තබා ගැනීම, පැහැර ගෙන යාම, අපහරණය කිරීම හෝ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ii) එවැනි වෙනත් යම් තැනැත්තකුගේ ඉරණම සඟවන; හෝ

(iii) එකී වෙනත් යම් තැනැත්තකුගේ තදනන්තර හෝ වර්තමානයේ සිටින ස්ථානය හෙළිදරව් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැතහොත් වලංගු හේතුවක් නොමැතිව හෙළිදරව් කිරීමට නොහැකි වන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් අධිචෝදනා මත නඩු විභාග කිරීමෙන් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට එම තැනැත්තා යටත් වන අතර, රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට ද ඔහු යටත් වන අතර තවදුරටත් වින්දිතයෙකුට රුපියල් ලක්ෂ පහකට අඩු නොවන වන්දි මුදලක් ගෙවීමට ද එම තැනැත්තා යටත් විය යුතු ය.

(3) (අ) යම් ප්‍රධානයකුගේ අධිකාරී බලය යටතේ හෝ පාලනය යටතේ සිටින්නන් (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කරමින් සිටි බවට හෝ සිදු කිරීමට අත්‍යාසන්නව සිටි බවට පැහැදිලිව පෙන්නුම් කරන තොරතුරු දැන සිටි හෝ සිතාමතා නොසලකා හරිනු ලැබූ;

(ආ) බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමේ වරද සිදු කිරීමෙහිලා හේතු සාධක වූ ක්‍රියාකාරකම් පාලනය කිරීමේ බලය සහ වගකීම දරනු ලැබූ; සහ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා හෝ යටපත් කිරීම සඳහා අවශ්‍ය හා සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වූ හෝ අවශ්‍ය වන අවස්ථාවක දී අදාළ කරුණ පිළිබඳව විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට එම කරුණ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබූ,

යම් ප්‍රධානයෙක් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදට වරදකරු විය යුතු අතර, මහාධිකරණය විසින් අධිචෝදනා මත නඩු විභාග කිරීමෙන් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට එම තැනැත්තා යටත් වන අතර, රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට ද ඔහු යටත් වන අතර තවදුරටත් වින්දිතයෙකුට රුපියල් ලක්ෂ පහකට අඩු නොවන වන්දි මුදලක් ගෙවීමට ද එම තැනැත්තා යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ "අයුතු සිර කර තැබීම", "අපහරණය" සහ "පැහැරගෙන යාම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 331, 350, 351, 352 සහ 353 යන වගන්තිවල ඇති අර්ථය ම ඇත්තේ ය.

*ආධාර දීම, අනුබල දීම, තැත් කිරීම සහ කුමන්ත්‍රණය.*

**4.** (1) 3 වන වගන්තියේ දක්වා ඇති වරදක් සිදු කිරීමට අධාර කරනු ලබන හෝ අනුබල දෙනු ලබන හෝ 3 වන වගන්තියේ දක්වා ඇති වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරනු ලබන හෝ තැත් කරනු ලබන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන අතර මහාධිකරණය විසින් අධිචෝදනා මත නඩු විභාග කිරීමෙන් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට එම තැනැත්තා යටත් වන අතර, රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට ද ඔහු යටත් වන අතර තවදුරටත් වින්දිතයෙකුට රුපියල් ලක්ෂ පහකට අඩු නොවන වන්දි මුදලක් ගෙවීමට ද එම තැනැත්තා යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ "අනුබල දීම" සහ "කුමන්ත්‍රණය" යන්නට පිළිවෙළින් දණ්ඩ නීති සංග්‍රහයේ 100, 101 සහ 113අ යන වගන්තිවල ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

*සංඥේය සහ ඇප දිය නොහැකි වරදක් වීම.*

**5.** මේ පනත යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥේය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

*මේ පනත යටතේ වැරදි මහාධිකරණය විසින් විභාග කළ යුතු වීම සහ දණ්ඩන නියමයන්.*

**6.** (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතේ 3 වන සහ 4 වන වගන්ති යටතේ වූ වැරදි විභාග කිරීම සඳහා කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයට අනන්‍ය අධිකරණය බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවන් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලැබූ අවස්ථාවක දී—

(අ) වරදකරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුව ද, එසේ නැති වුව ද, ඔහු ශ්‍රී ලංකාවේ අධිකරණ බල සීමාව තුළ පිහිටි යම් ප්‍රදේශයක සිටින්නේ නම්;

(ආ) වරද සිදු කළේ යයි කියනු ලබන තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් හෝ ඔහු සම්මුතියට පාර්ශ්වකරුවකු වන වෙනත් රාජ්‍යයක පුරවැසියකු නම් හෝ ශ්‍රී ලංකාවේ සිරිතක් ලෙස පදිංචි වී සිටින රටක් නොමැති තැනැත්තකු නම්; හෝ

(ඇ) එම ක්‍රියාව සිදු කරන ලද්දේ -

(i) ශ්‍රී ලංකාවේ ධජය යටතේ යාත්‍රාකරන නැවකට; හෝ

(ii) වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ ගුවන් යානයකට,

එරෙහිව නම් හෝ එවැන්නක් ඇතුළත නම්;

(ඈ) වරද සිදු කරනු ලැබූ බව කියනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද එම තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම්,

(1) වන උපවගන්තියේ සඳහන් මහාධිකරණයට එම වරද ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද වරදක් සේ සලකා විභාග කිරීම සඳහා අධිකරණ බලය ඇත්තේ ය.

මේ පනත යටතේ වූ වැරදි සඳහා සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

**7.** මේ පනත යටතේ වූ වරදක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාක දී -

(අ) එම තැනැත්තා පුරවැසියකු වන රාජ්‍යයේ හෝ එම තැනැත්තාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරයකට හිමිකම් ඇති රාජ්‍යයක ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ හෝ එම තැනැත්තා රටක් නොමැති තැනැත්තකු නම් ඔහු සිරිතක් ලෙස පදිංචිව සිටින රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ ප්‍රමාදයකින් තොරව සන්නිවේදන කටයුතු කිරීමට එම තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය;

(ආ) එම රාජ්‍යයේ නියෝජිතයකුට එම තැනැත්තා හමුවීමට පැමිණීමට හිමිකම් තිබිය යුතු ය;

(ඇ) (අ) සහ (ආ) ඡේද යටතේ එම තැනැත්තාගේ අයිතිවාසිකම් පිළිබඳව එම තැනැත්තාට දැනුම් දිය යුතු ය.

උදර්පණය කරන ලෙස ඉල්ලීමක් කර ඇත්තේ යම් තැනැත්තන් සම්බන්ධයෙන් ද එම තැනැත්තන්ට එරෙහිව ගනු ලැබූ පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින රාජ්‍යයට දැනුම් දිය යුතු බව.

**8.** මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ වූ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා සම්මුති රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන්, එම වරද සම්බන්ධයෙන් එම තැනැත්තාට නඩු පැවරීමට හෝ එම තැනැත්තා උදර්පණය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජනා කරනු ලබන පියවර පිළිබඳව, ඉල්ලුම් කරන රාජ්‍යයේ ආණ්ඩුවට නොපමාව ම දැනුම් දිය යුතු ය.

සම්මුති රාජ්‍යවලට සහාය දීම.

**9.** (1) මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ වූ වරදක් විමර්ශනය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා 2002 අංක 25 දරන සාපරාධී කාරණා වල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන, අවශ්‍ය වන කවර හෝ අවස්ථාවක දී එම විධිවිධාන, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වන වෙනත් රටවල් සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අතර සහාය ලබාදීම සම්බන්ධයෙන් හෝ එකී පනත ප්‍රකාරව සහාය ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රටවල් සම්බන්ධයෙන් සහාය ලබාදීම සම්බන්ධයෙන් එකී පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රටක් ද නොවන වෙනත් රටක් සම්න්ධයෙන් වන විට, ශ්‍රී ලංකාවේ

ආණ්ඩුව විසින් ස්වකීය වගකීම් ඉටු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට (සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගැනීම, සිතාසි භාරදීම සහ සෝදිසි කිරීම් සිදු කිරීම ඇතුළු) මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ වූ වරදක් විමර්ශනය කිරීමට සහ ඒ සඳහා නඩු පැවරීමට අවශ්‍ය වන පරිදි ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සියලු සහාය ලබා දිය හැකි ය; නැතහොත් අමාත්‍යවරයා හරහා සන්ධාන රාජ්‍යයකින් සියලු සහාය ඉල්ලා සිටිය හැකි ය.

(3) සම්මුති රාජ්‍යයකට සහාය ලබා දීම අමාත්‍යවරයා විසින් සුදුසු යයි සලකනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව සිදු කරනු ලැබිය හැකි ය.

සම්මුති රාජ්‍යයන් සමග දැනට පවත්නා උද්ධරණ වැඩපිළිවෙළවල් මඟින් වැරදි සඳහා විධිවිධාන සලස්වනු ලබන බවට සලකනු ලැබිය යුතු බව.

**10.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් සම්මුති රාජ්‍යයක් අතර, උද්ධරණ වැඩ පිළිවෙළක් බලාත්මකව ඇති අවස්ථාවක දී, එම වැඩපිළිවෙළ ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්ය සඳහා මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් උද්ධරණය කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාව සහ ඇතැම් සම්මුති රාජ්‍ය අතර උද්ධරණ වැඩපිළිවෙළක් ලෙස අමාත්‍යවරයා විසින් සම්මුතිය සලකනු ලැබිය හැකි ය.

**11.** ශ්‍රී ලංකා ආණ්ඩුව සහ යම් සම්මුති රාජ්‍යයක් අතර ඇති කරගත් උද්ධරණ වැඩපිළිවෙළක් බලාත්මකව නොපවතින අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ කාර්ය සඳහා සම්මුති පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් උද්ධරණය සඳහා වූ විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එම සම්මුති රාජ්‍ය සමග ඇති කර ගන්නා ලද උද්ධරණ වැඩපිළිවෙළක් වශයෙන් සම්මුතිය සලකනු ලැබිය හැකි ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනත සංශෝධනය කිරීම.

**12.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධරණ පනතේ උපලේඛනයේ 'ආ' කොටසට පෙරාතුව ඇති අයිතමවල 37 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මඟින් එකී පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(37අ) 2017 අංක දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ විෂය පථය යටතට ගැනෙන වරදක්.".

මේ පනත යටතේ වූ වැරදි උද්ර්පණ පනතේ කාර්ය සඳහා දේශපාලන වැරදි නොවිය යුතු බව.

**13.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පණ පනතේ කුමක් සඳහන් වුව ද, හෝ මේ පනත යටතේ වූ වරදක් එම නීතියේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන වරදක්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ යම් සම්මුති රාජ්‍යයක් අතර හෝ මේ පනතේ 9 වන වගන්තිය යටතේ සම්මුති රාජ්‍යයකට සහාය දීමේ කාර්ය සඳහා එම වරදට චෝදනා ලැබ සිටින හෝ වරදකරු වී ඇති යම් තැනැත්තකු උද්ර්පණය කිරීමේ කාර්ය සඳහා පමණක් දේශපාලන ස්වභාවයේ වරදක් ලෙස හෝ දේශපාලන වරදක් හා සම්බන්ධ වී ඇති වරදක් ලෙස හෝ දේශපාලන අරමුණු අනුව සිදුකරන ලද වරදක් ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් සම්බන්ධයෙන් වින්දිතයන්ට සහ ඥාතීන්ට ඇති අයිතිවාසිකම්.

**14.** (1) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් පිළිබඳ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් වූ සත්‍ය තත්ත්වය පිළිබඳව ද නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් පවත්වනු ලබන විමර්ශනවල ප්‍රගතිය සහ එහි ප්‍රතිඵල පිළිබඳව ද අතුරුදහන් වූ තැනැත්තාගේ ඉරණම පිළිබඳව ද දැන ගැනීමේ අයිතිවාසිකම සෑම වින්දිතයකුට ම සහ වින්දිතයෙකුගේ ඥාතීන්ට ඇත.

(2) 3 වන වගන්තිය යටතේ සිදුකරන ලද වරදවල්වල අවස්ථානුගත කරුණු කවරේ ද යන්න සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඉරණම කුමක් ද යන්න ස්ථාපිත කර ගැනීමට උත්සාහ කිරීම අරමුණු කොට ගත් සංවිධාන හා සංගම් නිදහසේ පිහිටුවා ඒවාට සහභාගීවීමේ අයිතිය සහ 3 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වින්දිතයකු වූ තැනැත්තකුට නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන්ගේ සහාය ලබා ගැනීමේ අයිතිය ද සෑම වින්දිතයකුට ම හෝ වින්දිතයකුගේ ඥාතියකුට ම නීතිය මඟින් නියම කර ඇති සීමාවන්ට යටත්ව තිබිය යුතු ය.

(3) යම් තැනැත්තකු 3 වන වගන්තිය යටතේ වූ වරදකට භාජනය වූ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක විධිමත් පැමිණිල්ලක් නොතිබුණ ද නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් විමර්ශනයක් ආරම්භ කළ යුතු ය.

(4) නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් විසින් අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳව සෝදිසි කර ඔහු සොයා ගැනීම සඳහා සියලු පියවර ගත යුතු අතර, රහස් ස්ථානයක රඳවා තබාගෙන සිටින තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම තැනැත්තා මුදා ගැනීම සඳහා පියවර ගත යුතු ය. එසේ ම අතුරුදහන් වූ තැනැත්තා මියගොස් ඇති අවස්ථාවක එම තැනැත්තාගේ දේහය සොයා ගෙන ඊට ගෞරව දක්වා එය ආපසු භාරදීම සඳහා කටයුතු කළ යුතු ය.

නිදහස අහිමිවීම සම්බන්ධයෙන් යුතුකම්.

**15.** (1) කිසිම තැනැත්තකු රහස් ස්ථානයක රඳවා තබා නොගත යුතු ය.

(2) නිදහස අහිමි වූ යම් තැනැත්තකුට ලිඛිත නීතිය මගින් ස්ථාපිත කොන්දේසිවලට පමණක් යටත්ව, තම ඥාතීන්, නීතිඥවරයකු හෝ ඔහු කැමති වෙනත් තැනැත්තකු සමඟ සන්නිවේදනය කිරීමට සහ එම ඥාතීන්ට, නීතිඥවරයකුට හෝ ඔහු කැමති වෙනත් යම් තැනැත්තකුට නිදහස අහිමි වූ එම තැනැත්තා හමුවීමේ අයිතිය ඇත.

(3) නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන්ට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට තැනැත්තන්ගේ නිදහස අහිමිකර ඇති ස්ථානවලට ප්‍රවේශවීමේ අයිතිය ඇත.

(4) නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් විසින් නිදහස අහිමි වූ තැනැත්තන් පිළිබඳ නිල රෙජිස්ටර හෝ වාර්තා යාවත්කාලීන කර සකස් කර පවත්වාගෙන යා යුතු අතර යම් අධිකරණයක් හෝ වෙනත් බලයලත් අධිකාරියක් විසින් හෝ තත්කාර්ය සඳහා නීතිය මගින් බලය පවරා ඇති ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට වහාම ඒවා ලබා දිය යුතු අතර, එම රෙජිස්ටරවල හෝ වාර්තාවල -

(අ) නිදහස අහිමි වූ තැනැත්තාගේ අනන්‍යතාවය;

(ආ) යම් තැනැත්තකුගේ නිදහස අහිමි කළ සහ නිදහස අහිමි කළ දිනය, වේලාව සහ ස්ථානය යන එම තැනැත්තාගේ නිදහස අහිමි කළ අධිකාරියේ අනන්‍යතාවය;

(ඇ) නිදහස අහිමි කිරීමට අණ දුන් අධිකාරිය සහ නිදහස අහිමි කිරීමට හේතු;

(ඈ) නිදහස අහිමි කිරීම අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;

(ඉ) නිදහස අහිමි කළ ස්ථානය, නිදහස අහිමි කළ ස්ථානයට ඇතුළු කළ දිනය හා වේලාව සහ නිදහස අහිමි කිරීමේ ස්ථානය සඳහා වගකිව යුතු අධිකාරිය;

(ඊ) නිදහස අහිමි කළ තැනැත්තාගේ සෞඛ්‍ය තත්ත්වයට අදාළ තොරතුරු;

(උ) නිදහස අහිමි කර තිබූ කාලය තුළ මරණය සිදු වී නම්, මරණය සිදු වූ අවස්ථාගත කරුණු සහ හේතුව සහ දේහයේ ගමනාන්තය; සහ

(ඌ) නිදහස අහිමි වූ තැනැත්තා නිදහස් කළ හෝ වෙනත් නිදහස අහිමි කළ ස්ථානයකට මාරු කළ දිනය හා වේලාව, නිදහස අහිමි කළ තැනැත්තා මාරු කරනු ලැබූ නිදහස අහිමි කළ ස්ථානයේ ගමනාන්තය සහ මාරු කිරීමට වගකිව යුතු අධිකාරිය.

ඥාතීන්ගේ, නියෝජිතයන්ගේ සහ නීතිඥවරුන්ගේ අයිතිවාසිකම්.

**16.** (1) නිදහස අහිමි වූ තැනැත්තකුගේ ඥාතියකුට, නිදහස අහිමි වූ තැනැත්තකුගේ නියෝජිතයකුට හෝ නිදහස අහිමි වූ තැනැත්තකුගේ නීතිඥවරයකුට පහත දැක්වෙන තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිය තිබිය යුතු යः-

(අ) නිදහස අහිමි කළ යුතු බවට නියෝග කළ තැනැත්තා හෝ අධිකාරිය පිළිබඳ තොරතුරු;

(ආ) යම් තැනැත්තකුගේ නිදහස අහිමි කළ දිනය, වේලාව සහ ස්ථානය සහ නිදහස අහිමි කළ ස්ථානයට ඇතුළත් කළ දිනය සහ වේලාව;

(ඇ) නිදහස අහිමි කිරීම, අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;

(ඈ) නිදහස අහිමි වූ තැනැත්තා සිටින ස්ථානය සහ එම තැනැත්තා නිදහස අහිමි කිරීමේ වෙනත් ස්ථානයකට මාරු කිරීමේ දී එම තැනැත්තා මාරු කළ ස්ථානය හා මාරු කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;

(ඉ) නිදහස් කළ දිනය, වේලාව සහ ස්ථානය;

(ඊ) නිදහස අහිමි වූ තැනැත්තාගේ සෞඛ්‍ය තත්ත්වයට අදාළ තොරතුරු; සහ

(උ) නිදහස අහිමි කර තිබිය දී මරණය සිදු වූ විට, මරණය සිදු වූ අවස්ථානුගත කරුණු හා මරණයට හේතුව සහ දේහයේ ගමනාන්තය.

(2) නිදහස අහිමි වූ තැනැත්තකුට අදාළ තොරතුරු සෝදිසි කිරීමේ ප්‍රතිඵලයන් ලෙස යම් අනිසි ලෙස සැලකීමෙන්, තර්ජනවලට භාජනය වීමෙන් හෝ දඬුවම් පැමිණවීමකින් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු සහ විමර්ශනයට සහභාගී වන තැනැත්තන් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකුගේ නිදහස අහිමි කිරීමේ නීත්‍යානුකූල භාවය සලකා බැලීමට අගති විරහිතව, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමේ ක්‍රමයක් ලෙස ඉක්මන් හා ඵලදායි අධිකරණමය ප්‍රතිකර්මයන් ලබා ගැනීමේ අයිතිය (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුට තිබිය යුතු අතර, ප්‍රතිකර්මයක් සඳහා වූ එම අයිතිය කිසිදු අවස්ථානුගත කරුණක දී අත්හිටුවීම හෝ සීමා කිරීම නොකළ යුතු ය.

විමර්ශනවලට මැදිහත් වීම සහ බලපෑම් කිරීම සහ තොරතුරු වාර්තාගත කිරීම පැහැර හැරීම හෝ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම.

**17.** (1) මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ වූ වරදක් සිදු කළ බවට සැක කරනු ලබන්නා වූ තැනැත්තකු ද ඇතුළුව-

(අ) යම් විමර්ශනයක් පැවැත්වීමේ දී ඊට මැදිහත් වන;

(ආ) පීඩනයක් ඇති කිරීමෙන් හෝ පැමිණිලිකරු, සාක්ෂිකරුවන්, අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතීන් හෝ ඔවුන්ගේ නීතිඥවරුන් හෝ විමර්ශනයට සහභාගී වන තැනැත්තන් ඉලක්ක කොට තර්ජනය කිරීමේ හෝ බැන වැදීමේ ක්‍රියා මගින් විමර්ශනයේ ප්‍රගතියට බලපෑම් කරන;

(ඇ) නිල රෙජිස්ටරය සඳහා වගකිව යුතු නිලධරයා වශයෙන් සිටිය දී යම් තැනැත්තකුගේ නිදහස අහිමිවීම වාර්තාගත කිරීම ඕනෑකමින් පැහැර හරින හෝ සාවද්‍ය බව ඔහු විසින් දැන සිටින යම් තොරතුරක් වාර්තාගත කරන;

(ඇ) යම් තැනැත්තකුගේ නිදහස අහිමිවීම පිළිබඳ තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් වූ නීතිමය නියමයන් සපුරා තිබිය දී එය නොතකා එම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන හෝ සාවද්‍ය තොරතුරු ලබාදෙන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු වන යම් තැනැත්තෙක්, මහාධිකරණය ඉදිරිපිට අධිචෝදනා මත පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තාට අවුරුදු හතකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකින් සහ රුපියල් පත් ලක්ෂයකට වැඩි නොවන දඩයක් මගින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

යම් තැනැත්තකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ ඉඩකඩක් ඇතිවිට ඔහු උදර්පණය නොකළ යුතු බව.

**18.** (1) යම් තැනැත්තකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ අවධානමක් ඇති බවට විශ්වාස කිරීමට සැලකිය යුතු හේතු ඇති විට කිසිම තැනැත්තකු වෙනත් රාජ්‍යයකට පිටමං කිරීම, ආපසු යැවීම, භාරදීම හෝ උදර්පණය කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් හේතු තිබේ ද යන්න තීරණය කිරීමේ කාර්ය සඳහා අදාළ අවස්ථාවල දී මානව හිමිකම් බරපතළ ලෙස, සාහසික ලෙස හෝ විශාල වශයෙන් උල්ලංඝනය කිරීම් හෝ ජාත්‍යන්තර මනුෂ්‍යවාදී නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් අදාළ රාජ්‍යයේ පැවතීම ඇතුළු සියලු අදාළ සලකා බැලීම් සැලකිල්ලට ගත යුතු ය.

(3) යම් තැනැත්තකු වෙනත් රාජ්‍යයකට පිටුවහල් කළ යුත්තේ, එම තැනැත්තා ආපසු ලබා දිය යුත්තේ, භාරදිය යුත්තේ හෝ උදර්පණය කළ යුත්තේ යම් නිර්ණායක මත ද එම නිර්ණායක නියම කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂා කිරීම.

**19.** මේ පනත යටතේ සිදු කරනු ලබන වරදකට අදාළ සාපරාධී නඩු කටයුතු වල දී තොරතුරු භාවිත කිරීමට හෝ සහන ලබා ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමට අගතිවිරහිතව, අතුරුදහන් වූ තැනැත්තකු සෙවීමේ රාමුව තුළ එකතු කරනු ලබන හෝ ප්‍රේෂණය කරනු ලබන වෛද්‍ය හා ජාන දත්ත ඇතුළු පෞද්ගලික තොරතුරු

අතුරුදහන් වූ තැනැත්තා සෙවීම හැර වෙනත් කාර්යයක් සඳහා භාවිත කිරීම හෝ ලබාදීම හෝ නොකළ යුතු අතර, යම් තැනැත්තකුගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස හෝ සමාජ තත්ත්වය උල්ලංඝනය වන ආකාරයට හෝ උල්ලංඝනය වීමේ බලපෑම ඇති කරවන ආකාරයට එම තොරතුරු එකතු කිරීම, පිරිසැකසුම් කිරීම, භාවිත කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම.

**20.** (1) යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ විධිවිධාන සලසා ඇති යම් අධිකරණමය හෝ වෙනත් ප්‍රතිකර්මයකට අගති විරහිතව, මේ පනතේ 7, 14, 15, 16 හෝ 19 යන වගන්තිවල විධිවිධාන බලාත්මක කරන ලෙස ඉල්ලා සිටිමින් මහාධිකරණය අමතන පෙත්සමක් මගින් ඉල්ලීමක් කිරීමට සහ එම පෙත්සමේ අයැද ඇති පරිදි සහන හෝ පිළියම් ඉල්ලා සිටීමට නීත්‍යානුකූල අයිතිවාසිකමක් ඇති තැනැත්තකුට හිමිකම් තිබිය යුතු ය.

(2) මේ පනතේ 7, 14, 15, 16 හෝ 19 යන වගන්තිවල විධිවිධාන බලාත්මක නොකිරීම පිළිබඳව දැන ගැනීමට ලැබුන දින සිට මාස තුනක් ඇතුළත නීත්‍යානුකූල අයිතියක් ඇති යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි එම තැනැත්තා විසින් ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් මේ පනතේ (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණයේ අධිකරණ බලයේ පිහිට පැතිය හැකි ය.

(3) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමකට අදාළ නඩු කටයුතුවල කවර හෝ අවස්ථාවක දී මහාධිකරණය විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවක දී මහාධිකරණය විසින් එම කරුණ විභාග කර වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කළහැකි අතර, තත් කාර්ය සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළ මහාධිකරණය වෙත එම වාර්තාව ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමින් අයැද ඇති සහන ප්‍රදානය කිරීමට හෝ නඩුවේ අවස්ථානුගත කරුණු අනුව සාධාරණ හා යුක්ති සහගත යයි අධිකරණය විසින් සලකනු ලබන වෙනත් සහන ප්‍රදානය කිරීමට හෝ එවැනි විධාන කිරීමට මහාධිකරණයට බලය තිබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ගොනු කරන ලද යම් පෙත්සමක දී මහාධිකරණය විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට, එම ආඥාව ප්‍රකාශයට පත් කළ දින සිට සති හයක් ඇතුළත එම ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් මාර්ගෝපදේශ හෝ විධාන නිකුත් කිරීම.

**21.** මෙම සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් සම්පූර්ණයෙන් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට මෙම සම්මුතියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ හෝ එවැනි සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි ය.

නියෝග.

**22.** (1) මේ පනතේ යම් විධිවිධානයකට අගති විරහිතව මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ නියමිත නියම කර ඇති හෝ බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

මේ පනතේ විධිවිධාන, වෙනත් ලිඛිත නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

**23.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**24.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**25.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතෙහි -

"එලදායී අධිකාරිය සහ පාලනය" යන්නෙන්, යටතේ වැඩ සිටින්නන්ට අණ නිකුත් කිරීමේ බලය සහ එවැනි නියෝගවලට අනුගතවීම සහතික කිරීමේ හැකියාව අදහස් වේ;

"නිදහස අහිමි කිරීම" යන්නෙන්, යම් තැනැත්තකු යම් විශේෂිත ස්ථානයක රඳවා තබා ගැනීම සම්බන්ධව එම තැනැත්තාගේ කැමැත්තෙන් තොරව එම තැනැත්තා එම විශේෂිත ස්ථානයේ රඳවා තබා ගැනීම අදහස් වේ;

"ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව" යන්නෙන්, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදහස් වේ;

"නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන්" යන්නෙන්, පොලිස් නිලධරයකු හෝ යම් වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීමට යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ බලය පවරා ඇති යම් තැනැත්තකු හෝ ආයතනයක් අදහස් වේ;

"රහසේ රඳවා තබා ගැනීම" යන්නෙන් යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ බලයලත් රඳවා තබා ගැනීමේ ස්ථානයක් නොවන ස්ථානයක තැනැත්තකු රඳවා තබා ගැනීම සහ එම තැනැත්තා සිටින ස්ථානය හෝ ඔහුගේ ඉරණම එම තැනැත්තාගේ ඥාතීන් හෝ වෙනත් තැනැත්තන් නොදන්නා අවස්ථානුගත කරුණු අදහස් වේ;

"වින්දිතයා" යන්නෙන්, යම් අතුරුදහන් වූ තැනැත්තකු සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදු වී ඇති පුද්ගලයකු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.